# නාමශේෂ හා විද්‍යමාන පාලි ව්‍යාකරණ

පහලගම ධම්මික හිමි

ත්‍රිපිටකය අධ්‍යයනය කිරීමේ දී භාෂාව විග්‍රහ කිරීම තේමාකරගත් ව්‍යාරණ ක්‍රමයක් දක්නට නොලැබුණත් බුද්ධ භාෂිතය තුළ නූතන ව්‍යාකරණයේ අනන්‍ය මර්යාදාවන් කථොපකථනය කළ හැකිය. එයින් ව්‍යාකරණ ඉගැන්වීමේ ආධ්‍යාශයක් ත්‍රිපිටකයේ අනාවරණය නොවේ. එමෙන් ම තදීය අට්ඨකතා හා ටීකාවල දී ද එකී ව්‍යාකරණ ලක්ෂණ දක්නට ලැබේ. මහාගෝසිංග සූත්‍රයේ ආනන්ද තෙරුන් ධර්මදේශනයේ පැවතිය යුතු ලක්ෂණ කීපයක් ප්‍රකාශ කරයි. ''සො චතස්සානං පරිසානං ධම්මං දෙසෙති, පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි අප්පාබාදෙහි අනුසයසමුග ඝතාය'' [1] මෙම දස පද බ්‍යඤ්ජන පද පිළිබඳ අර්ථ වර්ණනා කරන අටුවාචාරීන් එහි ලක්ෂණ දහයක් පෙන්වාදෙයි.

''සිථිලධනිතං ච දීඝරස්ස
ලහුකගරුකඤ්ච නිග්ගහීතං,
සම්බන්ධං වවත්ථිතං විමුත්තං
දසධා බ්‍යඤ්ජන බුද්ධිප්පභෙදා'' [2]

ධර්ම දේශනයේ දී සිදු කරන වචන උච්චාරණය සඳහා සිථිල (අල්පප්‍රාණාක්ෂර) ධනිත (මහප්‍රාණාක්ෂර) දීඝ (දීර්ඝාක්ෂර) රස්ස (හ්‍රස්වාක්ෂර) ලහුක (කේවල හ්‍රස්වාක්ෂර) ගරුක (දීර්ඝ, ප්ලුත, බන්ධානාක්ෂර, හල් අක්ෂර හා නිග්ගහීතයට පෙර හ්‍රස්වාක්ෂරය) නිග්ගහීතය (බින්දුව) සම්බන්ධ (පූර්වා පරාක්ෂර සම්බන්ධය) වවත්ථිත (පද බෙදීම) විමුත්ත (හඬනිකුත් කිරීම)[3] පැවැතිය යුතු ලක්ෂණ මෙයින් ගම්‍ය වෙයි. දසාකාර වූ බ්‍යඤ්ජනබුද්ධිය[4] උච්චාරණයේ දී ඉතා උසස් යැයි පෙනේ. එසේම නාම පදයේ අංග හතරකි. ''චතුබ්බිදං වා නාමං ආවත්ථිකං

ලිංගිකං නෙමිත්තකං අධිච්චසමුප්පන්නත්තිකං'' විමතිවිනෝදනී ටීකාවේදී ''ආවත්ථාය ආවත්ථිකං එවං ලිංගිකං නිමිත්තතො ආගතං නෙමිත්තං, අධිවචනං යංකිඤ්චි අධිවචනං අනපෙක්ඛිත්වා පවත්තං අධිච්චසමුප්පන්නං'' වශයෙන් විවරණය කරයි. ථෙරවාදී සාහිත්‍යයේ මූලික ව්‍යාකරණමය වූ ලක්ෂණ සොයා ගැනීමට පුළුවනි. එයින් ස්ඵුට වන්නේ ථෙරවාදී ග්‍රන්ථ මූලික කොට ගෙන අට්ඨ කථා යුගයට පෙර ලක්දිව කිසියම් ව්‍යාකරණ ක්‍රමයක් තිබූ බව පෙනෙයි. අට්ඨ කථා යුගයේ දී දැනට නාම ශේෂව පවත්නා ව්‍යාකරණ ක්‍රමයක් අටුවාචාරීන් භාවිත කොට ඇති අට්ඨ කථා අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි. එකී ව්‍යාකරණ සඳහා පෙළ තුළ දක්නට ලැබෙන ව්‍යාකරණ ඡායා ගුරු කොට ගත් බව උපකල්පනය කළ හැකිය.

අට්ඨ කථා රචනයේ දී දැනට ලක්දිව සුභාවිත ව්‍යාකරණ රචනා වී නොමැති හෙයින් වෙනත් ව්‍යාකරණ භාවිත කොට ඇත. එය සුපැහැදිලි සාක්ෂිය වන්නේ අට්ඨ කථාවන්හි දී විභක්ති හඳුන්වා ඇති ආකාරායයි. සාමාන්‍ය විභක්ති සංඛ්‍යාත් ක්‍රමයට නම් කො ඇත. නමුත් පැරණි ව්‍යාකරණයේ දී විභක්ති හඳුන්වනේ මෙසේය, පඨමා (පච්චත්ත) දුතියා (උපයෝග) තතියා (කරණ) චතුත්ථී (සම්ප්‍රදාන) පඤ්චමී (නිස්සක්ක) ඡට්ඨී (සාමි) සත්තමී (භුම්ම) ආලපන (ආලපන විභක්ති සඳහා පරණි ව්‍යාකරණයේ නමක් හමු නොවේ.) නමුත් ආලපන හා සම්බන්ධ යන නාමයන් භාවිත කරනු ලබයි. මෙ විභත්ති නාම නම්,

''තං තං අත්ථමවෙක්ඛිත්වා
භුම්මෙන කරණෙන ච
අඤ්ඤත්‍ර සමයො යුත්තො
උපයොගෙන සො ඉධාති''[6]

සංස්කෘත ක්‍රමයට විභත්ති නම් කළත් ඉපැරණි ව්‍යාරණයේ දී ස්වාධීන නම් යොදා තිබෙන බව පෙනේ. මුල් බුදු සමයේ දී පශ්චාත්තන යුගයන්හි දී පාලි භාෂාව සඳහා ව්‍යාකරණ ඉගැන්වීමේ නිශ්චිත ක්‍රමෝපපායයන් විද්‍යමාන නොවේ. පස් වැනි සියවසේ බුද්ධඝෝස අට්ඨකථාචාරීන් මහා විහාරයට සම්ප්‍රප්ත වීමේ දී ලක්දිව භාවිත වූ ව්‍යාකරණ ග්‍රන්ථ ගණනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

1. නිරුත්ති ප්‍රකරණය
2. මහානිරුත්ති ව්‍යාකරණය
3. චූල නිරුත්ති ව්‍යාකරණය
4. සබ්බගුණාකාර ව්‍යාකරණය
5. බෝධිසත්ත ව්‍යාකරණය [7]

දැනට නාම ශේෂ ව්‍යාකරණ ග්‍රන්ථ කීපයක් පිළිබඳ තොරතුරු හමුවේ. මෙම ව්‍යාකරණය සද්දලක්ඛණ නමින් හඳුන්වා තිබෙයි.[8] ''වණ්ණාගමො වණ්ණවිපරියායොති ආදිකං නිරුත්ති ලක්ඛණං ගහෙත්වා සද්දනයෙනවා'' යනුවෙන් ව්‍යාකරණ විධීන් දක්වන ස්ථානයේ දී ''සද්දනය'' යනුවෙන් හඳුන්වන්නේ සමකාලීනව පැවැති ව්‍යාකරණ ශාස්ත්‍රයන් විය හැකිය. ඉපැරණිම ව්‍යාකරණය වශයෙන් සැලකෙන්නේ නිරුත්ති ප්‍රකරණයයි. මෙහි කර්තෘත්වය මහකච්චායන හිමියන්ට පවරනු ලබයි. [9]චූලනිරුත්ති හා නිරුත්ති පිටකය ග්‍රන්ථ දෙකක් වශයෙන් පෙනෙයි. [10]චූලනිරුත්ති ව්‍යාකරණය යමක නම් තෙර නමක් විසින් රචිත බව පයෝගසිද්ධි (1974 සංස්කරණ) සංඥාපනයේ දී කෝදාගෙ ඤාණාලෝක හිමියෝ ප්‍රකාශ කරති. සබ්බගුණාකාර ව්‍යාකරණය හා බෝධිසත්ත ව්‍යාකරණය මුල් කාලයේ ව්‍යාකරණ ග්‍රන්ථ වශයෙන් අට්ඨකථාචාරීන් සිය අට්ඨකථාකරණයේ දී භාවිත කළ බව සිතිය හැකිය. සබ්බගුණාකාර ව්‍යාකරණයේ දී මොග්ගල්ලානය මෙන් ම අක්ෂර හතලිස්තුනක් නිර්දේශ කරයි. ''සිද්ධක්ඛමාදයො වණ්ණකරාතිතාළිසා''[11] බෝධිසත්ත ව්‍යාකරණයේ දී කච්චායන හා මොග්ගල්ලාන යන ව්‍යාකරණ සම්ප්‍රදායයන් දෙකම අනුව නොයමින් අනන්‍ය වූ ක්‍රමයක් භාවිත කොට ඇති බව පෙනේ යයි. අක්ෂර හතළිහක් නිර්දේශ කරනු ලබයි. ''නරවරවචනොපකාරානි චත්තාළීසක්ඛරා''[12] ඉපැරණි නාම ශේෂ පාලි ව්‍යාකරණ මූලාශ්‍ර කොට ගෙන විද්‍යමාන පාලි ව්‍යාකරණ ග්‍රන්ථ සකස් වන්නට ඇති බව පෙනේ.

ටීකා ග්‍රන්ථ තුළ සංස්කෘත භාෂා විෂයික සංඛ්‍යාත්මක ක්‍රමයට විභත්ති හඳුන්වා තිබීමෙන් පෙනී යන්නේ එකල විද්‍යමාන ව්‍යාකරණ සකස්වන්නට ඇති බවයි. අට්ඨකථා රචිත යුගයට පූර්වයෙන් පාලි ව්‍යාකරණ ග්‍රන්ථ පැවැති බවත් ඒවා මූලික වශයෙන් පෙළේ ඡායා මාත්‍ර

වශයෙන් හමුවන ව්‍යාකරණ ලක්ෂණ උපයුක්ත කරමින් සකස් කළ බවත් එකී නාමශේෂ පාලි ව්‍යාකරණ මුල් කර ගනිමින් විද්‍යාමාන පාලි ව්‍යාකරණ සකස් වන්නට ඇති බවත් පෙනීයයි.

## කච්චායන ව්‍යාකරණය

ලංකාවේ විද්‍යාමාන පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අතර ඉතාම ජනප්‍රිය මෙන් ම ඉපැරණි ව්‍යාකරණ සම්ප්‍රදාය වන්නේ කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායයයි. මෙකී ව්‍යාකරණ සම්ප්‍රදාය සතුව ව්‍යාකරණ ග්‍රන්ථාවලියක් දක්නට තිබේ. සරළ ව්‍යාකරණයේ සිට ගැඹුරු ව්‍යාකරණය දක්වාම එකී ග්‍රන්ථ සම්ප්‍රදානය කොට තිබේ. එයින් කච්චායන ව්‍යාකරණය බොහෝසෙයින් ලක්දිව භාවිත වෙයි. මෙහි කර්තෘ පිළිබඳ එකමතික නිගමනයක් උගතුන් අතර නැත. කච්චායන ව්‍යාකරණයේ කර්තෘ අවන්ති ජනපදයේ වාසය කළ මහාකච්චාන තෙරුන් බව සඳහන් වන අතර මහාකච්චායන තෙරුන්ගේ පූර්ව ප්‍රාර්ථනයක් හේතුවෙන් මහානිරුත්ති ප්‍රකරණය, නෙත්තිප්‍රකරණය හා කච්චායන ව්‍යාකරණය කළ බව දැක්වෙයි. ''අත්තනො පුබ්බපත්ථනාවසෙන කච්චායනප්පකරණං මහානිරුත්තප්පකරණං නෙත්තිප්පකරණංති පකරණත්තයං සංඝමජ්ඣෙ බ්‍යාකාසි''[13] මහාරූපසිද්ධි ටීකාවේ දී බුදුරදුන් සංක්ෂිප්ත වශයෙන් දේශනා කළ සූත්‍රය මහකච්චායන තෙරුන් විසින් විස්තර වශයෙන් අර්ථ විභජනය කරමින් කච්චායන ව්‍යාකරණය රචනා කළ බව දක්නට ලැබේ.[14] මහාකච්චායන තෙරුන්ට කච්චායන ව්‍යාකරණයේ කර්තෘත්වය කච්චායන සුත්තනිද්දේසයේ දී ද පවරණු ලබයි. බුදුරදුන්ගේ ශ්‍රී මුඛ දේශනාවක් ලෙස ''අත්ථො අක්ඛර සඤ්ඤාතො'' යන සූත්‍ර පාඨය මුල් කරගෙන මහාකච්චායන තෙරුන් විසින් කච්චායන ව්‍යාකරණය රචනා කළ බව මෙයින් සුසූචිතය. එසේ ම තත් කර්තෘත්වය කච්චායනවණ්ණනාවේ [16] දී ද මහාකච්චායන තෙරුන්ට බාරකරනු ලබයි. මෙකී ව්‍යාකරණයේ කර්තෘත්වය මහාකච්චායන හිමියන්ට පැවරීම පාරම්පරික ප්‍රපඤ්චයක් සේ පෙනේ, ඊට අමතරව පිළිගත හැකි සුසාධකයන් දක්නට නැත. කෙසේ වෙතත් කච්චායන ව්‍යාකරණය ඒකකර්තෘක කෘතියක් නොවෙයි.

> ''කච්චානෙන කතො යොගා වුත්තී ච සංඝනන්දිනා,
> පයොගො බ්‍රහ්මදත්තෙන න්‍යාසො විමලබුද්ධිනා''

මෙයින් සදෘශ්‍ය වන්නේ කච්චායන ව්‍යාකරණයේ සූත්‍ර පමණක් කච්චායන නාමයෙන් හඳුන්වන ලබන කිසියම් තෙර නමක විසින් රචනා කළ බවයි. ඊට අදාළ වෘත්ති සම්ප්‍රදානය සංඝනන්දි නම් වූ තෙර කෙනෙකු විසින් හා උදාහරණ බ්‍රහ්මදත්ත නම් තෙර කෙනෙකු විසින් රචනා කළ බවයි. සූත්‍ර, වෘත්ත හා උදාහරණ යන අංග තුනේම ඒකමිතිය කච්චායන ව්‍යාකරණය නමින් හඳුන්වනු ලබයි. කච්චායන ව්‍යාකරණය බුද්ධ කාලීන මහාකච්චායන තෙරුන් විසින් රචනා වූවා නම් ක්‍රි:පූ: 05 වන සියවසේදී පමණ රචනා කළ අට්ඨකථා සඳහා බුද්ධඝෝස හිමියන් මෙම කච්චායන ව්‍යාකරණය යොදා ගැනීම කළ යුතුය. නමුත් ප්‍රාග් අට්ඨකථා යුගයේ දී තිබූ ව්‍යාකරණ භාවිත කොට තිබේ. මෙසේ බලන විට කච්චායන ව්‍යාකරණ පශ්චාත්කාලීන කෘතියක් බව පෙනී යයි. ඊට හේතුව ටීකා සම්පාදනයේ දී කච්චායන ව්‍යාකරණය භාවිත කිරීමයි. ඒ අනුව කච්චායන ව්‍යාකරණය 10 හෝ 11 වැනි සියවස්වල දී රචනා වූ බව බොහෝ විද්වතුන් කල්පනා කරයි. කච්චායන ව්‍යාකරණය රචිත කාලය පිළිබඳ එළඹිය හැකි නිගමනය වන්නේ අට්ඨකථා හා ටීකා රචිත කාල පරාශය අතර රචනා කරන්නට ඇති බවයි.

කච්චායන ව්‍යාකරණයේ සූත්‍ර 675 අන්තර්ගත වන අතර එකී සෑම සූත්‍රයක් ම වෘත්ති හා උදාහරණ දක්වමින් එහි විහිත කාර්යය නිර්දේශ කරයි. සියලු සූත්‍ර මඟින් සිදුවෙන කාර්යය මුල්කොට ගනිමින් වර්ග හයකට වෙන් කර තිබේ.

> ''සඤ්ඤා ච පරිභාසා ච විධිං නියමමෙව ච
> අතිදේසාධිකාරෝ ච ඡබ්බිධං සුත්තලක්ඛණං'' [19]

යනුවෙන් සංඥා සූත්‍ර, පරිභාෂ සූත්‍ර, විධි සූත්‍ර, නියම සූත්‍ර, අතිදේශ සූත්‍ර හා අධිකාර සූත්‍ර යනුවෙන් වෙන් කොට ගත හැකිය. පරිච්ඡේද ''කප්ප'' යන නාමයෙන් හඳුන්වා ඇත. කප්ප අටක් පුරා ව්‍යාකරණ විවරණය කරනු ලබයි. කච්චායන ව්‍යාකරණයේ දී කප්ප වශයෙන් බෙදීමේ දී ස්වකීය විභජන ක්‍රමය අපිළිවෙලක් දක්නට ලැබේ. කච්චායන ව්‍යාකරණය පාලි ව්‍යාකරණයේ කේන්ද්‍රීය ග්‍රන්ථයකි. කච්චායන ව්‍යාකරණය මුල් කොටගෙන රචිත ටීකා අනු ටීකා හා සන්න

රාශියකි. ඒ අතර මුඛමත්ථදීපනී අනුටීකාව, නිරුක්තිසාර මඤ්ජුසා, කසයින් සන්නේ, මුඛමත්ථදීපනී සන්නය, රූපසිද්ධි ව්‍යාකරණය. රූපසිද්ධි ටීකාව, සන්දේශ විඝාතනී පුරාණ සන්නය, රූසිද්ධි පුරාණ සන්නය, බලාවතාරය, සුබෝධිකා ටීකාව, ගඩලාදෙණි සන්නය, බලාවතාර සුගණ්ඨි සන්නය, බලාවතාර බලන සන්නය, බලාවතාර ලියන සන්නය, බලාවතාර සූත්‍ර නිර්දේශය, අභිනව චූල නිරුත්තිය හා චූල නිරුත්තිය, සද්දසාරත්ථජාලිනී, සද්දසාරත්ථජාලිනී ටීකාව, කච්චායන භේදය, සාරත්ථවිකාසිනී, කච්චායන භේදවණ්ණනා, කච්චායන භේදය, කච්චායන පුරාණ ටීකාව, සම්මොහනාසිනී, බාලප්පබෝධිනී හා ටීකාව, සද්දබින්දු, ලීනත්ථසූදනී, සද්දබින්දු අභිනව ටීකාව, සදත්ථභේද චින්තා හා ටීකාව, කාරිකාව, පද භේදය, සුධිරමුඛමණ්ඩණය හා කාරක පුප්ඵමඤ්ජරී, ණයලක්ඛණ විභාවිනී, නිරුත්ති සංගහ, සද්දවුත්ති, අභිධානප්පදීපිකා, අභිධානප්පදීපිකා සූචි, කච්චායන ධාතුමඤ්ජුසා, පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල, කච්චායන විග්ගහ, කච්චායන විග්ගහ ටීකා, රූප මාලා, සද්දමාලාව හා ආඛ්‍යාත රූප මාලාව, ප්‍රධාන වෙයි. කච්චායන ව්‍යාකරණ ග්‍රන්ථය මුල් කරගනිමින් ඒ හා තදනුබද්ද ව්‍යාකරණාවලියක් විහිදී ගිය බව ප්‍රකටව පෙනෙයි.

## මොග්ගල්ලායන ව්‍යාකරණය

කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායයට පසුව රචනා කළ ව්‍යාකරණ සම්ප්‍රදාය වන්නේ මොග්ගල්ලායන ව්‍යාකරණයයි. එම නිසා මොග්ගල්ලායන ව්‍යාකරණය ලක්දිව රචිත දෙවැනි ව්‍යාකරණය ලෙස පිළිගනී. මෙය මාගධ සද්දලක්ඛණ යන අපර නාමයෙන් ද හඳුන්වනු ලබයි. වස්කඩුවේ සුභූති හිමියන් සිය නාමමාලාවේ දී මොග්ගල්ලායන ව්‍යාකරණය හඳුන්වන පර්යාය නම් දෙකක් දක්වයි. ''මොග්ගල්ලානවෘත්ති, කච්චායන අමරසිංහ''[20] යනුවෙනි. මෙම මොග්ගල්ලායන ව්‍යාකරණය රචනා කළ කාල පරාශය වන්නේ ක්‍රි:ව: 1153-1186 අතර කාලයයි. එනම් පොළොන්නරු යුගයේ මහාපරාක්‍රමබාහු රාජ සමයයි.[21] මෙයින් ප්‍රකට වන්නේ මොග්ගල්ලාය හිමියන්ගේ බුද්ධිය හා මොග්ගල්ලායන ව්‍යාකරණයේ වෘත්ති උන්වහන්සේ විසින් රචනා කළ බවයි. වෘත්ති පමණක් නොව ඊට අදාළ වණ්ණනාව වූ පඤ්චිකාව ද මොග්ගල්ලායන හිමියන් ම රචනා කොට තිබේ. මොග්ගල්ලායන

හිමියන් පිළිබඳව මහාවංස ප්‍රකාශනය වනනේ ද පොළොන්නරු යුගයේ වාසය කළ බවයි.[22] මොග්ගල්ලාන හිමියන් සතු ගුණ කදම්බය වර්ණනාත්මක ස්වභාවයෙන් ඒ පිළිබඳව වාසිත යුගනිශ්චයප්‍රාප්ත වීමට සාධකයක් මොග්ගල්ලායන පඤ්චිකාවේ දී දක්වේ.[23] එසේ ම රාහුල හිමියන්ගේ පදසාදන ටීකාවේ දී මොග්ගල්ලායනාචාර්යන් පිළිබඳ ප්‍රකාශ වෙයි. මොග්ගල්ලායන හිමියන් මෙහි කර්තෘවරයා බව මෙයින් ගම්‍ය වෙයි. w.geiger ප්‍රකාශ කරන්නේ අනය මතයන්ට වඩා වෙනස් මතයක් බව පෙනි යයි. මොග්ගල්ලායන හිමියන් අනුරාධපුර ථූපාරාමයේ වැඩ සිටි බවයි.[25] මොග්ගල්ලායන ව්‍යාකරණය වනාහි කච්චායන ව්‍යාකරණයෙන් වියුක්ත රචනා මාර්ගයක් අනුගමනය කොට තිබේ. එසේ සංස්කෘත ව්‍යාකරණයට නැඹුරුවීම ද දක්නට ලැබෙන විශේෂත්වයකි. ''අ ආදයො තිසාළිසාවණ්ණා'' යනුවෙන් අක්ෂර හතිස් තුනක් දක්වන අතර කච්චායන ව්‍යාකරණයට වඩා වෙනස්කම්වලින් යුත්තය. එසේ ම නිශ්චිත වශයෙන් ද කච්චායන ව්‍යාකරණයට පසුව රචනා කර තිබේ. ඊට හේතුව කච්චායන ව්‍යාකරණයේ යම් යම් ස්ථාන විවේචනයට ලක්කරමින් මොග්ගල්ලායන මතය දැක්වීමයි. පළමුව සූත්‍ර හා උදාහරණ දක්වමින් පසුව උදාහරණ දක්වා තිබේ.

> ''ථෙරෙන යං සද්දසත්ථං රචිතා තස්සවුත්ති
> පුනතෙනෙව රචිතා මොග්ගල්ලානෙන''

මොග්ගල්ලායන ව්‍යාකරණය සතුව සූත්‍ර 816 දක්නට ලැබේ. එකී සූත්‍ර එක් කරමින් ග්‍රන්ථය පරිච්ඡේද හයකට සංග්‍රහ කොට තිබේ. පරිච්ඡේද කාණ්ඩ වශයෙන් නම් කරයි.

1. සංඥා කාණ්ඩය
2. ස්‍යාදී කාණ්ඩය
3. සමාස කාණ්ඩය
4. ණාදී කාණ්ඩය
5. ඛ්‍යාදී කාණ්ඩය
6. ත්‍යාදී කාණ්ඩය

තත් ව්‍යාකරණය ප්‍රථම සංඥා කාණ්ඩයේ දී සන්ධි කාර්ය සඳහා

සූත්‍ර 58 යොදා ගනී. ස්‍යාදී කාණ්ඩය කාරක නාම වරනැගීම සඳහා සූත්‍ර 243 ක් ද ස්ත්‍රී ප්‍රත්‍ය හා සමාස දක්වන සාමාස කාණ්ඩය සඳහා සූත්‍ර 116 ද තද්ධිත දක්වන ණාදී කාණ්ඩය සඳහා සූත්‍ර 142 ද කිතක දක්වන ඛාදී කාණ්ඩය සඳහා සූත්‍ර 179 ද අවසාන ත්‍යාදී කාණ්ඩයේ දී ව්‍යාකරණ විධි ක්‍රම ආඛ්‍යාත වරනැගීම සඳහා සූත්‍ර 78 ද භාවිත කොට තිබේ. මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදාය සතුව පශ්චාත් කාලීනව රචිත ව්‍යාකරණ ග්‍රන්ථ රාශියක් දක්නට ලැබේ. ඒ අතර මොග්ගල්ලායන පඤ්චිකාව, මොග්ගල්ලායන විරිත සන්නය, පදසාධනය, පදසාධන සන්-නය, බුද්ධිපසාදිනී, පදසාධන ටීකාව, පයෝග සිද්ධිය, සම්බන්ධචින්තා, සම්බන්ධචින්තා ටීකා, සම්බන්ධ චින්තා පුරාණ සන්නය හා පඤ්චිකා ප්‍රදීපය ප්‍රධාන වෙයි.

## සද්දනීති ව්‍යාකරණය

පාලි ව්‍යාකරණ ග්‍රන්ථ අතර සුවිශාලතම ව්‍යාකරණය සද්දනීතියයි. එසේ ම තෙවැනි ව්‍යාකරණ සම්ප්‍රදාය ද මෙයයි. සද්දනීතිය ලක්දිව රචනා කළ කෘතියක් නොවෙයි. එය බෙහෝ උගතුන්ගේ උත්තානීකරණයෙන් සක්සුදක් සේ පැහැදිලිය. මෙය රචිත දේශය බුරුමයයි. ලක්දිවට ආගන්තුක ව්‍යාකරණ සම්ප්‍රදායකි. බුරුමයේ අරිමද්දන නුවර අග්ගමහා පණ්ඩිත අග්ගවංස හිමියෝ මෙහි කර්තෘ වරයාණෝ වෙති. රචිත වර්ෂය ලෙස 1154 බොහෝ දෙනා පිළිගනිති.[27] M.H.Bode ප්‍රකාශ කරන්නේ පගාන් නුවර අනවරථ රජුගේ කලයේ සද්දනීතිය රචනා වූ බවයි. W.geiger මෙහි කර්තෘවරයා පිළිබඳ සඳහන් කරයි. කර්තෘත්වය බුරුමයේ අරිමද්දන නුවර අග්ගවංස හිමියෝ බවත්, මෙම සද්දනීතිප්පකරණය උත්තරජීව හිමියන් ලක්දිවට රැගෙන ආ බවත්, රචිත වර්ෂය වශයෙන් ඔහු පෙන්වාදෙන්නේ 1154 වර්ෂයයි.[28] පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ අදහස වන්නේ මහාපරාක්‍රමබාහු යුගයේ දී සද්දනීතිය ලක්දිවට ගෙන නො ආ බවයි.[29] වස්කඩුවේ සුභූති හිමියන් හා ගුණපාල මලලසේකර වැනි උගතුන් ඒකමතිකත්වයෙන් සද්දනීති කර්තෘත්වය අග්ගවංස හිමියන් බව පිළිගනී.[30] තත් ග්‍රන්ථ කතෘනාමසන්දර්ශයේ දී අග්ගවංස හිමියෝ සමන්තභද්ද නම් අග්ගමහාපණ්ඩිත මහතෙරුන්වෙත උපාධ්‍යාග්‍රහණය කළ ඒ අග්ගමහාපණ්ඩිතයන්ගේ ම ශිෂය වූ සමන්තභද්ද වූ දෙවැනි අග්ගපණ්ඩිත තෙරුන්ගේ සොහොයුරියකගේ පුත්‍ර වූ ඒ අග්ගපණ්ඩිත

නාමය ලැබූ සුසම්පදා ඇති කරණසම්පත්තීන් හටගත් නිවැරදි වචන ඇති අරිමද්දන නුවර වාසී අග්ගවංස හිමියන් විසින් කරන ලද සද්දනීති ප්‍රකරණය නිමි බව ප්‍රකාශ කරති.[31] අග්ගවංස හිමියන් විසින් රචිත සද්දනීතිප්පකරණය උත්තරජීව තෙරුන් විසින් පොළොන්නරු යුගයේ දී ලක්දිවට ගෙනැවිත් තිබේ. මෙය පරිච්ඡේද 28 ක් තුළ ගාථා 770 ද සූත්‍ර 1347 අන්තර්ගත වෙයි. බණවර 70 පමණ වෙයි. මෙහි දී ''පරිච්ඡේද'' එම නාමයෙන් ම නම් කොට තිබේ. අනෙක් සියලු ව්‍යාකරණ අභිබවා මෙය සුවිශාල වෙයි. තත් ග්‍රන්ථය පිලිබඳ හඳුන්වන ස්ථානවලදී චූලසද්දනීතිය හා මහාසද්දනීතිය වශයෙන් ව්‍යවහාර කරනමුත් කර්තෘ එසේ විභේදනයකට ලක් නොකරයි. මෙහි පරිච්ඡේද 19 වැයකරන්නේ නාමපද හා ක්‍රියාපද පිළිබඳ විස්තර විභාග කිරීම සඳහාය. විසි වැනි පරිච්ඡේදයේ සිට විසි අට වැනි පරිච්ඡේදය දක්වා ව්‍යාකරණයට අදාළ සූත්‍ර ඉදිරිපත් කරමින් සන්ධි, සමාස, තද්ධිත, ආඛ්‍යාත හා කෘදන්ත උගන්වනු ලබයි. සද්දනීති ව්‍යාකරණය ප්‍රධාන වශයෙන් කොටස් ත්‍රයක් ඔස්සේ පරිච්ඡේද සංග්‍රහ කොට තිබේ.

1. පදමාලා
2. ධාතුමාලා
3. සුත්තමාලා

පදමාලා කොටසේ දී නාම පදවල හා ක්‍රියා පදවල සියලු විස්තර ඉදිරිපත් කරන අතර ධාතුමාලා කොටසේ දී ධාත්වාර්ථ හා ආඛ්‍යාත වරනැගීම විස්තර කරයි. සුත්තමාලා කොටසේ දී ''අප්පභුතෙකතාලීවණ්ණාසද්දා''[32] සන්ධි ආදී ව්‍යාකරණ කාර්ය විහිත සූත්‍ර දක්නට අනෙක් ව්‍යාකරණයන්ට වඩා වෙනස් මාර්ගයක් ඔස්සේ මෙකී ව්‍යාකරණය ගොඩ නගා ඇති බව පෙනී යාම විශේෂත්වයකි.

## ආන්තික සටහන්

[1] මජ්ඣිම නිකාය, 510 පිටුව.

[2] මහානිද්දේස අට්ඨකථා 123, පිටුව. අංගුත්තර නිකාය අට්ඨකථා i, 409 පිටුව. මහා සද්දනීතිප්පකරණ 799 පිටුව. අරුග්ගොඩ සීලානන්ද හිමි (සංස්කරණ) 1909.

[3] සුමංගල විලාසිනී, 170 පිටුව, කංඛාවිතරණී ටීකා, 49 පිටුව, යූ.පී. ඒකනායක, (සංශෝධනය) 1923.

[4] සද්දසාරත්ථජාලිනී, 101 පිටුව,

[5] විසුද්ධිමග්ග, 155 පිටුව. ඛුද්දකපාඨ අට්ඨ කථා, 69 පිටුව. මහානිද්දේස පාළ අට්ඨ කථා, 187 පිටුව. විභංග අට්ඨ කථා, 75 පිටුව. සංයුත්ත නිකාය ටීකාව, 49 පිටුව. සද්දනීප්පකරණ, 772,773 පිටු. The Path of purification, 224,225p.

[6] මජ්ඣිම නිකාය i, 09 පිටුව. විසුද්ධිමග්ග, 384 පිටුව. විභංග අට්ඨ කථා, 64 පිටුව.

[7] මහා සද්දනීතිප්පකරණ 799 පිටුව. පදසාධන ටීකාව i පිටුව. (විඥප්ති) ඒ.බී.ඒ. විජේසිංහ, 1908. බාලාවතාර ටීකාව ii පිටුව. (විඥාපන) එච්. සුමංගල හිමි, (දෙවැනි සංස්කරණ) 1913.

[8] විසුද්ධිමග්ග 155 පිටුව.

[9] අපදාන පාළි අට්ට කථා ii, 417 පිටුව. 1941.

[10] මජ්ඣිම නිකාය අට්ඨ කථා 89 පිටුව.

[11] එම,

[12] එම,

[13] අපදාන පාළි අට්ට කථා ii, 417 පිටුව.

[14] මහාරූපසිද්ධි ටීකා 314, 315 පිටු. කලුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි (සංස්කරණ) ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964.

[15] කච්චායන සුත්තනිද්දේසය 03 පිටුව. එච්. සුමංගල හිමි (සංස්කරණ) බුඃවඃ 2448. එකො බුද්ධිපබ්බජිතො භගවතො සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා අනොතත්තතීරෙ සාලරුක්ඛමූලෙ නිසින්නො උදයබ්බයකම්මට්ඨානං කරොති. සො උදකෙ චරන්තං බකං දිස්වා උදක බකන්ති කම්මට්ඨානං කරොති. භගවා තං විතතභාවං දිසවා බුද්ධිපබ්බජිතං පක්කොසාපෙත්වා අත්ථො අක්ඛර සඤ්ඤාතොති වාක්‍යමාහ. කච්චායන ථෙරොපි භගවතො ආදිප්පායං ජානිත්වා අත්ථො අක්ඛර සඤ්ඤාතොති වාක්‍යං පුබ්බෙ ඨපෙත්වා ඉදං පකරණං කතන්ති. කච්චායනෙන කතසුත්තම්පි වදන්ති.

[16] කච්චායන වණ්ණනා 08 පිටුව. අත්ථො අක්ඛර සඤ්ඤාතොති ආදිමහ ඉදං සුත්තං කෙන වුත්තං භගවතා වුත්තං කදා වුත්තන්තීති යම උපල නාමකා ද්වෙ බ්‍රාහ්මණා බයවය කම්මට්ඨානං ගහෙත්වා ගච්ඡන්තා නදීතීරෙ බයවයං බයවයන්ති කම්මට්ඨානෙ කායිරමානෙ එකො උදකෙ මච්ඡං ගණ්හිතු චරන්තං බකං දිස්වා උදක බකොති විජ්ජති එකො සටං පටං දිස්වා සටපටොති විජ්ජති තදා භගවා ඔභාසං මුඤ්චිත්වා අත්ථො අක්ඛර සඤ්ඤාතොති වාක්‍යං ඨපෙති තෙසඤ්ච කම්මට්ඨානං පතිට්ඨති තස්මා භගවතා වුත්තන්ති මුඤ්චති තං ඤත්වා මහාකච්චායනො භගවන්තං යාචිත්වා හිමවන්තං ගහෙත්වා මනොසිලාතලෙ දක්ඛිණදිසා භාගං සීසං කත්වා පුරථිම දිසාමුඛො හුත්වා අත්ථො අක්ඛර සඤ්ඤාතො ත්‍යාදිකං කච්චායනප්පකරණං විරචි. ථෙරෙන ඨපිතත්තා වුත්තං.

[17] එම, iii පිටුව.

[18] ශ්‍රී ලංකාවේ පාලි ව්‍යාකරණ පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්, 76 පිටුව. කොටපිටියේ රාහුල හිමි. හොරණ 1993. ලංකා පාලි සාහිත්‍යය 135 පිටුව. ගුණපාල මලලසේකර, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම කොළඹ, 1965.

[19] රූපසිද්ධිය ව්‍යාකරණය 154 පිටුව.

[20] නාමමාලා xxx පිටුව. වස්කඩුවේ සුභූති හිමි, මංගල මුද්‍රණාලය, මරදාන 1965.

[21] මොග්ගල්ලායන ව්‍යාකරණය නිගම ගාථා,

පරක්කම භුජේ තස්මිං
සද්ධා බුද්ධි ගුණොදිතෙ,
මනනුවංසද්ධජාරෙ ලංකාදීපම්පසාසසති.
මොග්ගල්ලානෙන ථෙරෙන දීමතා සුචි වුත්තිනා,
රචිතං තං සුවිඤ්ඤෙය්‍යා මසංදිග්ධමනාකුලං.
අසෙසවිසයව්‍යාපී ජිතව්‍යප්පථ නිස්සයං,
සද්දසත්ථමතායයථ සාධියං බුද්ධි වද්ධනං
තස්සවුත්ති සාසෙන විපුලත්ථප්පකාසිනී,

[22] මහාවංසය, 505 පිටුව, 37 පරිච්ඡේදය, 09 ගාථාව,

සමොග්ගල්ලානෙනථෙරඤ්ච ථෙර නාගින්දපල්ලියං,
යුවරාජස්ස රට්ඨස්මිං අඤ්ඤෙ සබ්බෙ ච භික්ඛවො.

[23] මොග්ගල්ලායන පඤ්චිකාව, 03 පිටුව. රාහුල හිමි තොටගමුවේ, (සංශෝධන) 1896

යා ශක්තිඃ පාණිනෞඩයාච චාන්ද්‍රකාකත්‍යායනාදිසු,
යෙ යං මූර්තිමතී මන්‍යෙ මෞද්ගල්‍යායනරූපිණී.

[24] පදසාදන ටීකාව, 07 පිටුව. විජයසිංහ ඒ.ඩී.ඒ. (සංස්කරණ) 1908. ධම්මානන්ද ජී. (සංස්කරණ) 1887. මොග්ගල්ලානො ච ආචරියො ච මොග්ගල්ලානාචරියොති ඉමිනා සුතසීලාදී ගුණෙහි ලොක සම්මත මාගධස්ස සද්දලක්ඛණස්ස කත්තාරං මහාසාමිඨානාන්තරප්පත්තමත්තනො ආචරියං දස්සෙති, සොයෙව සද්දත්ථකරණෙ අත්තනො උත්තරීභාවෙන වරො පවරො තං ච නනු ච යං තං සද්දානං නිච්චො සම්බන්ධො කථං මොග්ගල්ලායනාචරියවරඤ්චාපි එත්ථ තං සද්දභාවො.

[25] Pàli Literature and Language 53p. Wilhem Griger, University of Calcutta, 1996. There With is Suely Meant Parakkamabhahu I (1153-1186 A.D). Moggallana Was an Inhabitant of Anuradhapura, Where he Was Member of Tha Thuparama

මොග්ගල්ලායන ව්‍යාකරණය 01 පිටුව. දේවමිත්ත හිමි (සංශෝධන) කොළඹ 1919.

[27] The Pàli Literature of Burma, 16p. Bode Malel Haynes London 1966. Jouríl of the Pàli Text Society (Vole xvii) 2p. Exploring the saddniti, E.G. Kahars.

[28] මහා සද්දනීතිප්පකරණ 814 පිටුව.

[29] පාලි සාහිත්‍යය 471 පිටුව. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන 2002.

[30] නාමමාලා xiix, ලංකා පාලි සාහිත්‍යය 136 පිටුව.

[31] මහා සද්දනීතිප්පකරණ 814 පිටුව. ඉති සමන්තභද්දස්ස මහා අග්ගපණ්ඩිතස්ස සන්තිකේ ගහිතුප්පජ්ඣෙන තං සිස්ස සමන්තභද්ද අග්ගපණ්ඩිතස්ස භාගිනෙය්‍යෙන පටිලද්ධත්තනාමදෙය්‍යෙන සුසම්පදායෙන කරණසම්පත්තිජනිතනිරවජ්ජවචනෙන අරිමද්දනපුරවාසිනා අග්ගවංසචරියෙන කතං සද්දනීතිප්පකරණං නිට්ඨිතං.

[32] එම,